**ශීර්ෂය 145 - නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය**
**විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**
**-----------------------------------------------------**

**විගණන විෂය පථය**
**--------------------**

නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 නොවැම්බර් 12 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම**
**------------------------------------------------------------------------------------------**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන නිරීක්ෂණය**
**---------------------**

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා ඇති නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.7 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය සතුව රු.123,501,145 ක් වටිනා ස්ථාවර වත්කම් 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛණයක ඇතුළත් කර නොතිබුණි.

**(ආ) විසර්ජන ගිණුම**

**(i) මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.505,011,500 ක් වු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.486,977,088 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.18,034,412 ක් හෙවත් සියයට 3.6 ක් ඉතිරිවී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 177,892,000 | 167,876,412 | 10,015,588 | 5.6 |
| මුලධන | 327,119,500 | 319,100,676 | 8,018,824 | 2.4 |
| **එකතුව** | **505,011,500** | **486,977,088** | **18,034,412** | **3.6** |

**(ii) අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- වැය විෂයයක් සඳහා සළසා තිබුණු රු.300,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.
- වැය විෂයයන් 14 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 20 සිට සියයට 95 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

- වැය විෂයයන් 4 ක් සඳහා පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් රු.30,687,000 ක ප්‍රතිපාදන සළසා ගෙන තිබුණත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.5,251,439 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

**(ඇ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාල රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 14501 | 6,000,000 | 1,940,972 | 2,400,000 | 3,639,614 | 17,000,000 | 7,411,628 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විෂය අංක 14501 දරන අත්තිකාරම් ගිණුම පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු කේවල ශේෂවල එකතුව රු.239,205 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

## 1.4 යහ පාලනය සහ ගිණුම් කටයුතුභාවය

**අභ්‍යන්තර විගණනය**

අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපනය කර වර්ෂ 3 ක් ගතවී තිබුණත් ඒ සඳහා අභ්‍යන්තර විගණන නිලධාරීයෙකු පත් කර නොතිබුණු අතර වැඩබැලීමේ පදනම මත අභ්‍යන්තර විගණන නිලධාරීයෙකු පත්කර කර තිබුණි.

**1.5 වත්කම් කළමනාකරණය**

**-------------------------**

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

**----------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/ සමීක්ෂණ මණ්ඩල / 01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර 2014 මාර්තු 31 දිනට ප්‍රථම එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අමාත්‍යාංශය විසින් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2014 ජුනි 30 දින විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි.

(ආ) 2013 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වාදී තිබුණු අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 760 පරිදි කටයුතු කර නොතිබුණි.

**1.6 කාර්යසාධනය**

**--------------**

සමාලෝචිත වර්ෂයේ අමාත්‍යාංශයේ කාර්යසාධනය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂණයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) වැළිඔය නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතිය**

**--------------------------------------**

වැළිඔය නිවාස ඉදිකිරීමේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) ව්‍යාපෘතියේ පළමු අදියරේ නිවාස 500 ක් ඉදිකිරීම අරමුණුවී තිබුණු අතර ඉන් නිවාස 459 ක වැඩ අවසන් කර තිබුණි. එම වැඩ අවසන් නොවුණු නිවාස 16 ක ඉදිකිරීම් කටයුතු අත්හැර තිබුණි. තවත් නිවාස 25 ක වැඩ සම්පූර්ණයෙන් අවසන් කර නොතිබුණි.

(ii) උක්ත ව්‍යාපෘතියේ දෙවන අදියර 2013 අප්‍රේල් මාසයේදී ආරම්භ කර තිබුණු අතර 2013 ජූලි මාසය වන විට නිවාස 356 ක වැඩ අවසන් කිරීමට අපේක්ෂා කර තිබුණි. එම ව්‍යාපෘතිය සඳහා රු.117,000,000 ක පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙළ කර තිබුණි. මේ සඳහා අමාත්‍යාංශයට රු.74,657,303 ක් ද, මුලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට රු.32,531,625 ක්ද ප්‍රතිපාදනය සළසා දී තිබුණි.

2014 ඔක්තෝබර් 15 දින වන විටත් නිවාස දෙකක් පමණක් සම්පූර්ණයෙන් නිම කර තිබුණි.

**(ආ) කැළෑබෝගස්වැව නැවත පදිංචි කිරීම**

**-------------------------------------**

වවුනියා දිස්ත්‍රික්කයේ කැළෑබෝගස්වැව ගම්මානයේ අවතැන්වූ පවුල් 1,500 ක් පදිංචිකරවීම සඳහා වවුනියා දිස්ත්‍රික් ලේකම් වෙත පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් බලපත්‍ර 02 ක් මගින් රු.28,000,000 ක ප්‍රතිපාදන සළසා තිබුණි. වවුනියා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් අවතැන්වූ පවුල් 1,500 ක් සඳහා සිමෙන්ති මළු සහ සෙවිලි තහඩු මිලදී ගෙන තිබුණු අතර, අවතැන් වූ පවුල් 682 ක් වෙත බෙදාහරින ලද භාණ්ඩ පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**(ඇ) අනුරාධපුර පදවිය ප්‍රදේශයේ පවුල් 650 ක් නැවත පදිංචි කරවීම**

**------------------------------------------------------------------**

අනුරාධපුර පදවිය ප්‍රදේශයේ පවුල් 650 ක් නැවත පදිංචි කරවීමේ කටයුතු සඳහා පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් රු.4,999,452 ක ප්‍රතිපාදන ලබාදී තිබුණි. එම අවතැන්වූ පවුල්වලින්, පවුල් 312 ක් පිළිබඳ නාමලේඛනය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. තවද, සෙවිළි තහඩු 7,800 ක්ද, සිමෙන්ති මළු 5,200 ක් ද මිලදී ගැනිම සම්බන්ධව වියදම් වාර්තාවක් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**(ඈ) සුභසාධන සේවා සැපයීම**

**---------------------------**

සුභසාධන සේවා සැපයීම සඳහා දිස්ත්‍රික් 07 ක් වෙනුවෙන් රු.30,933,961 ක ප්‍රතිපාදන ලබාදී තිබුණු නමුත් 2013 දෙසැම්බර් 31 දිනට සුභසාධක සේවා සැපයීම සම්බන්ධයෙන් විස්තර වාර්තාවක් අමාත්‍යාංශය විසින් ලබාගෙන නොතිබුණි.

**1.7 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදිය.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** | **අතිරික්ත සංඛ්‍යාව** |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 11 | 08 | 03 | - |
| (ii) | තෘතියික මට්ටම | 05 | 02 | 03 | - |
| (iii) | ද්විතියික මට්ටම | 85 | 47 | 38 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 27 | 23 | 04 | - |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික / කොන්ත්‍රාත් පදනම මත) | - | 07 | - | 07 |
| | **එකතුව** | **128** | **87** | **48** | **07** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 48 ක් පිරවීමට අමාත්‍යාංශය අපොහොසත්වී තිබුණි. එසේම ද්විතීයික මට්ටමේ පුරප්පාඩු 38 ට අදාලව සංවර්ධන සහකාර තනතුරු 27 ක් වූ අතර ඒ සඳහා නිලධාරීන් බඳවා ගැනීමට සමාලෝචිත වර්ෂයේදී කටයුතු කර නොතිබුණි.